# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1703/45 - 2011 අප්‍රේල් 29 වැනි සිකුරාදා - 2011.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති නීතිය**

3(2) වැනි උපවගන්තිය යටතේ වූ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වැනි උපවගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මා විසින්, වරාය හා මහා මාර්ග විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා -

(1) ඉදිකර ක්‍රියාත්මක කර පැවරීමේ (BOT) පදනම මත කොළඹ වරාය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය යටතේ දකුණු කන්ටේනර් පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලබන අතර සීමාසහිත චයිනා මර්චන්ට් හෝල්ඩිංස් (ඉන්ටර්නැෂනල්) සහ ඒට්කන් ස්පෙන්ස් පීඑල්සී මූල්‍යායතන සමූහය සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙම ව්‍යාපෘතියේ කොටස්කරුවන් වෙති. මෙම ව්‍යාපෘතිය සීමාසහිත කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් සමාගම විසින් ක්‍රියා කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ මුළු ආයෝජනය ඇමෙරිකානු ඩොලර් මිලියන 466ක් පමණ වන අතර මෙවැනි ව්‍යාපෘතියක් ජාතික යහපත උදෙසා වන අතර එමගින් රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමි වනු ලැබේ ;

(2) ඉහත කී ව්‍යාපෘතිය, ක්‍රියාත්මක කරනු ලබන දිනය අදාළ ඉදිකර ක්‍රියාත්මක කර පැවරීමේ ගිවිසුමේ (BOT) සඳහන් දිනය බවට ප්‍රකාශ කරනු ලැබේ ;

(3) ඉහත කී ව්‍යාපෘතියෙහි කාර්යය සඳහා, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව, මෙම නිවේදනයේ උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට හෝ ව්‍යාපෘති සමාගම මගින් අනුමත කරන ලබන උප කොන්ත්‍රාත්කරුවන් හට අදාළ විය යුතු බවට නිශ්චිතව දක්වනු ලැබේ.

උපලේඛනය

(අ) **2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

- බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන මුල් වසරේ ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙක (02) කට පසු, කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර විසි පහ (25) කට ආදායම් බදු පනත යටතේ සංස්ථාපිත ආදායම් බදු නිදහස් කාල පරිච්ඡේදයක්, ඉන්මතු, පැහැදිලි කිරීමක් වශයෙන් ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර විසි පහ (25) ඉකුත් වීමෙන් පසුව එවකට බලපවතින සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාළ වනු ඇත. ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය සඳහා ගෙවන පොලිය සහ ව්‍යාපෘතිය මගින් සේවයේ යොදවනු ලබන උපදේශකයින්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගම නිදහස් කරනු ලැබේ.

1A - G 14473— 380 (2011/04)

- එකී වසර විසි පහ (25) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01) කට ලාභ වලින් කොටස්කරුවන්හට බෙදා දෙනු ලබන ලාභාංශවලට ආදායම් බදු නිදහස ලැබේ.

- සමාගමේ උපරිම ප්‍රවාසික සේවකයින් සංඛ්‍යාව විස්ස (20) කට වසර පහ (05) ක කාලයකට උපයන විට ගෙවිය යුතු බදු නිදහස අදාළ වනු ඇත.

(ආ) **2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

ගිවිසගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදිකිරීම් කාලය හෝ වසර පහ (05) කට දෙකින් කොයිකත් අඩු කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම විලම්බනය කරනු ලැබේ. එකතු කළ අගය මත බදු පනතේ 7 වැනි කොටසේ උප කොටස (1) හි (ආ) හෝ (ඇ) ඡේදයන්වල විධිවිධාන යටතේ ලබා දුන් සේවාවන් ඇතුළත් වන විට එකතු කළ අගය මත බදු ගෙවීම ශුන්‍ය අනුපාතිකයට ප්‍රමත කරනු ලැබේ. ශුන්‍ය අනුපාතිකයට ප්‍රමත කරනු ලබන සේවාවන් හැර කිසියම් සෙසු සේවාවන් මත සාමාන්‍ය පරිදි එකතු කළ අගය මත බදු ගෙවීම අදාළ වනු ඇත.

(ඇ) **2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ/ඉදිකිරීමේ කාලය තුළ අදාළ නොවනු ඇත.

(ඈ) **2011 අංක 10 දරන ජාතිය ගොඩනැංවීමේ බදු පනත**

ඉදිකර ක්‍රියාත්මක කර පැවරීමේ ගිවිසුමේ (BOT) සඳහන් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන දිනයෙහි සිට වසර හතක (7) ක කාලයක් සඳහා අදාළ නොවනු ඇත.

(ඉ) **2005 අංක 05 දරන මුදල් පනත**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ/ඉදිකිරීමේ කාලය තුළ ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් සහ ගෙවීම් අදාළ නොවනු ඇත.

(ඊ) **(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත**

සෘණ ලැයිස්තුවේ සඳහන් භාණ්ඩ හැර ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන්වලට අනන්‍ය වශයෙන් ආනයනය කරනු ලබන අයිතම් සම්බන්ධයෙන්, ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම මගින් ආනයනය කරන සියලු ප්‍රාග්ධන භාණ්ඩවලට රේගු බදු අයකිරීම්වලින් නිදහස් කිරීම් අදාළ වේ.කෙසේ වෙතත් දේශීය වෙළඳපොලේ එවැනි භාණ්ඩ ප්‍රමාණය සහ ප්‍රමිතියන් නොලැබෙන විට සෘණ ලැයිස්තුවේ සඳහන් අයිතම් සැලකිල්ලට ගනු ලැබේ.

බැසිල් රෝහණ රාජපක්ෂ, පා.ම.,
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2011ක් වූ අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ.

05-344

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.